WWW.OLEVELAPI.COM

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

50 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

නාට්‍ය හා රංග කලාව (සිංහල)	**I, II**
நாடகமும் அரங்கியலும் (சிங்களம்)	**I, II**
Drama and Theatre (Sinhala)	**I, II**

නාට්‍ය හා රංග කලාව (සිංහල) II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

1. දික්තල කාලගෝල නාට්‍යය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) දික්තල කාලගෝල නාට්‍යයේ සිංදු රාග තාල සහ රචනය කාගේ ද? (ලකුණු 02 යි)

(ii) මෙම නාට්‍යයේ පූර්ව රංගයේ ඇතුළත් වන චරිත **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) කාලගෝල තම බිරිඳ ලෙස දික්තල ලබාගත්තේ කෙසේ ද? (ලකුණු 02 යි)

(iv) දික්තල ගයන රත්දර සිරියා පරදන .....' යන සිංදුව අනුව ඇය ගේ සිතේ පවතින දුකට හේතුව කුමක් ද? (ලකුණු 02 යි)

(v) දික්පිටියා දුටු විට දික්තල ගේ සිත ඔහු වෙත ඇදී ගියේ ඇයි? (ලකුණු 02 යි)

(vi) නාට්‍ය අවසානයේ මහෞෂධ පඬිතුමා ගෝලයින්ට පවසන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

2. (i) ශාන්තිකර්ම පැවැත්වීමේ අරමුණු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) උඩරට ශාන්තිකර්මයක් නම් කර, එහි ඇති අන්තර් රංග අවස්ථා **තුනක්** දක්වන්න. (ලකුණු 04 යි)

(iii) ඉහත (ii) හි සඳහන් කළ අන්තර් රංග අවස්ථා අතුරෙන් **එකක්** තෝරාගෙන එහි දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

3. (i) සොකරි රඟ දැක්වීමේ අරමුණු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) සොකරි නාට්‍යයේ මූලික කතා පුවත කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) ඉහත (ii) හි සඳහන් කළ කතා පුවත රඟ දැක්වෙන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

4. (i) වර්තමානයේ නාට්‍ය රඟ දැක්වීමට වැඩි වශයෙන් භාවිත වන වේදිකා වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) රංග භූමිය මත රඟපෑමේ දී නළු-නිළියන් විසින් අවධානය යොමු කළ යුතු කරුණු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) රංග භූමිය මත නළු-නිළියන් ස්ථානගත කරන විට නාට්‍ය අධ්‍යක්ෂවරයා සැලකිලිමත් විය යුතු කරුණු මොනවා ද යි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

5. (i) 'කෙටි නාට්‍ය' යනු කුමක් දැ යි නිර්වචනය කරන්න. (ලකුණු 02 යි)

(ii) කෙටි නාට්‍යවලට ආවේණික සුවිශේෂ ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) කෙටි නාට්‍ය රචනයේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවා දැ යි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

[හත්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

6. (i) 1970 - 1990 අතර කාලය තුළ ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ ප්‍රකට රංගන ශිල්පියකු හා ශිල්පිනියක නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඉහත (i) හි නම් කරන ලද දෙදෙනා රඟපෑ නාට්‍ය **දෙක** බැගින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) ඉහත (i) හි සඳහන් කළ එක් රංගන ශිල්පියකු හෝ ශිල්පිනියක රඟ පෑ චරිත, ඒවා ඇතුළත් නාට්‍ය වර්ග හා රංග ශෛලිය, ඔවුන් ගේ නිරූපණ කුශලතා හා දක්ෂතා අගය කරමින් පාසල් බිත්ති පුවත්පතකට ලිපියක් සම්පාදනය කරන්න. (ලකුණු 06 යි)

7. පහත දැක්වෙන කථා සාරාංශය පදනම් කරගෙන ඒකාංක නාට්‍යයක් රචනා කරන්න. පැය කිහිපයක් තුළ සිදුවන සිද්ධීන් එක ස්ථානයකට සීමා වන සේ නාට්‍ය වස්තුව සකස් කළ යුතු ය.

චතුර සහ දසුන් එක ම පන්තියේ ඉගැනුම ලබන සිසුන් දෙදෙනෙකි. චතුර ගායනයට දක්ෂ ය. එහෙත් ඔහු ලජ්ජාශීලී නිසා කිසිදු තරගයකට ඉදිරිපත් නො වේ. දසුන් මුඛරී ය. අනුන් අනුකරණය කිරීමට දක්ෂයෙකි. අනුලා ගුරුතුමිය ළමා නාට්‍යයක් නිපදවීමට සූදානම් වේ. ගායනයට හා රඟපෑමට කැමති සිසුන්ට හෙට සිට නාට්‍ය පුහුණුවීම්වලට එන ලෙස ගුරුතුමිය දැනුම් දුන් බව දසුන් චතුරට පවසයි.

(i) පසුබිම, කාලය, සිදුවීම හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමඟ සංවාද රචනා කිරීම සඳහා (ලකුණු 04 යි)

(ii) චරිත අතර ගැටුමක් ඇති වන අයුරින් අවස්ථාව ගොඩනැගීම සඳහා (ලකුණු 04 යි)

(iii) කුතුහලය දනවන නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ලකුණු 04 යි)

* * *

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...